විසාකා

වර්ණ රසිකා ගුණවර්ධන



විසාකා
මට මහන්සියි හරියට
ඒ මදිවට හීතල .

ඒත් ...,
සඳ රැස් කැරැල්ලක් සමග
ඇවිත් නරඹමි නිදනයුරු ඔබ.

දකුණු පස ඇලයට හැරිගෙන
ඔබ නිදයි හුරු පුරුදු විදියට
කාලෙකින් කළු නොකළ හින්දද
ඔය හැටිම සුදු වුනේ කොණ්ඩය.

ඔබටත් මහන්සිද විසාකා?

සුදෝ සුදු සඳ රැස් කැරැල්ලක්
හෙමින් වැතිරෙයි ඔබ වසාගෙන
නළල සිඹ සැනසෙන්න හිතුනත්
විසාකා හරි හීතලයි මට.

ඔබටත් හීතලද විසාකා?

ඔබ නමින් ලියූ ලිපියකුත් ගෙන
පැකිලෙමින් ඔබ ළඟ රැකෙන්නෙමි
ඔබේ පිළිතුර කුමක් වේදැයි
සාංකාවෙන් බියෙන් ඉන්නෙමි.
මළානික ආකාශයේ දුර
තාරුකා දිළි දිළී මියයති
ඉතින් නික්මෙමි ඔබට දෙන්නට
මා වෙසෙන දෙස ලිපිනයක් නැති.

විසාකා
මට මහන්සියි හරියට
ඒ මදිවට හීතල .

අයාලේ ගිය හිතකට

එරංගා පෙරේරා

අහන්නට අකමැතිම නම්
ලියා තියන්නද සියලු දේ
හිතුන දවසක හිතේ හැටියට
හිතුනොතින් කියවන්න?

වචන වල තේරුම
නොදැණුනත් කමක් නෑ
ඉස්පිලි පාපිලි හෝ
හරියට තියේදැයි
එදාටවත් බලනවද?

නුහුරු ගතියක් වෙතොත්
වචනයක හෝ දෙකක
කොමාවක් සොයන්නට
වෙර නොදා,
සුපුරුදු පරිදි පුරුදු විදිහට
තිතක් වී නැවතෙන්න.

ඉනික්බිති
හිතක් පපුවක් නොමැති ගානට
හඳවත සීරෙන්න,
සී සී කඩ විසිරෙන්න.
නුහුරු තැන්වල පුරුදුකාරෙන්
ආයෙ ආයෙත් සිරවෙන්න.

පිං කැටය

ජයසේන කොඩිතුවක්කු

සැදැහැති දනෝ ලෝබය දුරු කරන සිතින්
පිං කැටයට දමති රුපියල දෙක සතොසින්
පිරුනම කැටය මේ සුළු සුළු මුදල් වලින්
පුදබිම අවැසි දේකට වැය වෙයි නිතැතින්

දන් දුන්නේ මුදල් අයිතිය අත් හැරලා
දුන් පසු කිම බලන්නේ විපරම් කරලා
අව භාවිත කලොත් සංඝය වහන්සෙලා
යම රජු සළකාවි ඒ අය කඳවාලා

ඉතිහාසයේ කවදාවත් නොදුටු දෙයක්
පිං කැට පස්සෙ එළවන්නේ අමන කමක්
සග සතු දේට අත තිබීබොත් ලොකුම පවක්
මොළයක් නැද්ද තේරෙන්නට මෙවැනි දෙයක්

බලයට ආපු සමහර අය නැතුව මොළේ
එල හරකුන් වගේ තීරණ ගන්න වෙලේ
කල කිරෙනවා සිහි කර ලකතිරයකල බලේ
ගිල ගෙන ඉදිමූ එනතෙක් හෙට ජඳ කොලේ

අපේ අම්මා

සනත් පියසේන

උදේ හිරු ගෙවැදුණේ ගතට පණ පොවන්නයි
දෙනෙත් මල් පිබිදුණේ යුතුකමට නැමෙන්නයි
දෙපා අත් එසවුණේ හඩන කුස නිවන්නයි
අපේ අම්මා වුණේ * අපේ පෙර පිනෙන්මයි

අප සැමට සුව සදා කුස ද දන " දුන්නීය
ලේ කිරෙහි බල මගිම දරු කැලට පෙන්නීය
කඳුළු කරදර පොදිය උර තලෙහි ගැන්නීය
දහදියෙහි ගුණ සුවඳ නොඅඩුව ම දැන්නීය

ගුරු ගෙදර නොදුටුවත් * අකුරුවල ගුණ සොබා
හැඳින දැන පන්හිඳත් තල්පතත් අත තබා
අරුණැල්ල දකිනඩයුරු දිනකරගෙ සෙත ලබා
ඇයයි පැහැදිලි කළේ පෙරට තැබූ පය නොබා

ලක්බිමේ වඳින තැන් පුදන තැන් පතළ නම
බුදුන් දිනූ, පදවි ලද, පිරිනිවුණු එතෙර බිම
වැඳ පිදුව පින් මගිම ඇය සතුය කුසල සැම
දුර නොවේ අම්මාට දකින්නට සසර ඉම

පිරුණු විය පැහැදිලිය කඳුළු නොම හෙලන්නෙමු
ඔබ දුන්නු සව් බලෙන් ඉදිරියත් ගෙවන්නෙමු
අප ලබන සියලු පින් සසර මග තබන්නෙමු
යළිත් නූපදින ලෙස කුසල් බල පතන්නෙමු

(අපේ අම්මා පරලෝසැපත් වී වසර පහ සිහිපත් කිරීමේ පින්කම දහහත් වැනි දින පිළියන්දල දී සිදු කිරීම වෙනුවෙනි.)

සෙනෙහස

මංගලිකා ප්‍රනාන්දු

ලිම්බෘක්

නුඹ කුසේ දිදුලන පුන්සඳ
නිල් විලේ සුපිපුණ ඉඳුවර
පිපි මලේ සුසිනිඳු මුවරද
සේ ම සුහදය නුඹේ සෙනෙහස

පත් මත සිනිඳු පිනි මුතු පැළඳ
නෙලුම් පිපී දිය මත තලෙට සැලෙන
විල් ඉවුර සිඹ නැළවෙන සියුම් රළ
ළඟින් වැතිර හිඳ විඳිනෙමි නුඹ සුවඳ

පෙරි පෙරි අතු අගින් සඳ කිරණ
එළවා දමයි සිත් මැදුලේ ගණ අඳුර
සුළං රැළි සිප ගනී තුරු වදුල
වෙන තත් සේම පිරිමඳිනා හඳ වියන

මල් වරණ අතු අගට නුඹ පියුම වේ නම්
දිය පවස නිවාලන උල්පතක් වේ නම්
කඳුලු මල් වියලන්න සෙනෙහසට හැකි නම්
ජීවිතේ යාත්‍රාව පදවන්න එන්නම්

දරු සම්පත

ජයසේන කොඩිතුවක්කු

වත්තල - ශ්‍රී ලංකා

පෙනුනට ගලක් ලෙස මගෙ සිත එක වරම
ගල යට වෙඩරු පිඩ උනු වෙයි ඔබ ගැනම
නැතුවට පිරුනෙ නෙත කඳුලින් හැම විටම
සයුරට ජලය ලෙස සෙනෙහස එක ලෙසම

ඇස් දෙක නොවෙයි පන වැනි මගෙ දෙන්නා
තිස් සෙම බාල වියෙ නැළවුවෙ කර පින්නා
අස් වනු කුඹුරෙ ලෙස දකිමින් දෙන්නා
රැස් වෙන සතුට හඳතුළ දැන් උතුරන්නා

පෙර කළ පිනෙන් හිමි වුන දරු මැණික් කැට
බර උනෙ නැහැනෙ කිසිවිට මගෙ දිවි මගට
පුර සඳ ලෙසට එළියයි මගෙ හඳ ගැබට
සර ණයි සමිඳු දළදා දරු දෙන්නාට

කැප වී සිප් සතර පරතෙරටම ගන්න
ගැළපෙන සහකාරි සහකරු තෝරගෙන
සරිලන පරිදි අත මිට සරු කර ගන්න
දුරු රටකට ගිහිනි අඳ සතුටින් ඉන්න

පිළිගමු සසර දුක සහ අනිසය දකිමින්
සැනසෙමු පමන දැන මිනිසුන් ලෙස පුහුදුන්
හැසිරෙමු දහම් මග බුදු හිමි දෙසුව ලෙසින්
දුරලමු බැඳුම් ටික ටික දැන අරුත නැණින්

එක්දහස් එක රැයක කතන්දර
පරදම් එක රැයින් කවි කර
ප්‍රේමයක මං ලකුණු පොබ කර
තනමි අහසක්! ඔබ සරා සඳ.

තුෂාරි ප්‍රියංගිකා